" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/06(A)   ඔබේ අංකය / உமது இலக்கம் / Your No.   දිනය / திகதி / Date 2021.02.05

## මූල්‍ය චක්‍රලේඛ 01/2021

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

### දේශීය කර්මාන්ත දිරි ගැන්වීමේ ප්‍රතිපත්තිය.

භාණ්ඩාගාර ලේකම් විසින් "දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය" සම්බන්ධයෙන් 2021.01.11 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2020(1) හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/03/2019 හා 2021.01.26 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම් පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office (94)-011-2484500 (94)-011-2484600 (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No PFD/MPD/Domestic/Cir.03/2020
ඔබේ අංකය / உமது இல / Your No
දිනය / திகதி / Date 2021.01. 11

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 (i)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

**දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය**

උක්ත කරුණට අදාලව නිකුත් කරන ලද 2020.10.09 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 හි 3 ඡේදය යටතේ වන 3.1 iii (ආ), iv හා v අනුඡේදයන් පහත පරිදි සංශෝධනය කෙරේ.

" 3.1. **ඉදිකිරීම් කර්මාන්තය;**

iii. ආ) (i) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 150ට වැඩි හා රුපියල් මිලියන 300 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවන් මත පදනම්ව, CIDA C3 හා C2 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1](උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

ආ) (ii) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 300 ට වැඩි හා රුපියල් මිලියන 600 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවන් මත පදනම්ව, CIDA C2 හා C1 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

---

[1] "දේශීය බහුතර හිමිකාරිත්වයක් සහිත ආයතන, ස්වදේශීය ආයතන හෝ දේශීය සමාගමක්" යනු ශ්‍රී ලාංකිකයින් විසින් සියයට 51 කට වැඩි හිමිකාරිත්වයක් දරනු ලබන සහ ශ්‍රී ලංකාවේ අදාළ අධිකාරියක් යටතේ එහි මුල් ලියාපදිංචිය සිදුකර ඇති ආයතනයක් වන අතර මෙම ලේඛණය සඳහා සමස්ථයක් වශයෙන් මෙම අර්ථ දැක්වීම අදාළ වේ.

iv. මෙම කර්මාන්ත සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යභාරය සැලකීමේදී, එකී රාජ්‍ය ව්‍යවසායන් විසින් තරඟකාරී මිල කැඳවීම් සඳහා මිල ගණනක් ඉදිරිපත් කර ඇති විට, එම රාජ්‍ය ව්‍යවසායන් සඳහා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට වඩා සියයට 5ක විශේෂ වරණයක් ලබා දෙනු ඇත. මෙම වරණය තාක්ෂණික ඇගයීමේදී නොව මූල්‍ය ඇගයීමේදී පමණක් ලබා දෙනු ඇත.

v. අසාමාන්‍ය ලෙස මිල උච්චාවචනයන් සහිත ලංසු ඉදිරිපත් වීම වැලැක්වීම තහවුරු කිරීම සඳහා පහත නිර්ණායක වලට අනුගත විය යුතු ය.

අ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11 සිට සියයට 19 දක්වා අඩු වන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය 5% කින් වැඩි කල යුතු ය.

ආ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 20 සිට සියයට 29 දක්වා අඩු වන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය 10% කින් වැඩි කල යුතු ය.

ඇ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 30 හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් අඩු වන අවස්ථාවලදී එම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු ය. "

එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති